# ජේ.ඒ.ටී.ආර්. ජයසිංහ එ. කුරුවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

RTIC Appeal (**පුද්ගලික වශයෙන් විභාග කිරීම**)/ 970 /2019 (2019.05.07 දින පැවති විධිමත් කොමිෂන් සභා රැස්වීමේ දී විභාග කිරීමෙන් අනතුරුව අනුමත කරන ලද නියෝගය).

2016 අංක 12 දරණ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 32(1) වගන්තිය ප්‍රකාරව කරන ලද නියෝගය සහ 2017 තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභා රීතීන්හි (ගාස්තු හා අභියාචනා කාර්යය පටිපාටිය), රීති අංක 28 යටතේ පවත්වාගෙන යනු ලබන කාර්යය පටිපාටිය.

**සභාපති:** මහින්ද ගම්මම්පිල
**කොමිෂන් සභා සමාජික:** ජොෂ්ඨ නීතිඥ කිෂාලි පින්ටෝ ජයවර්ධන
**කොමිෂන් සභා සමාජික:** ජොෂ්ඨ නීතිඥ එස්. ජී. පුංචිහේවා
**කොමිෂන් සභා සමාජික:** විනිසුරු රෝහිණී වල්ගම

**අභියාචක** - ජේ.ඒ.ටී.ආර්. ජයසිංහ
**නොතිසි ලත් පාර්ශවය** - ප්‍රාදේශීය ලේකම්, කුරුවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

**පෙනීසිටීම**
අභියාචක - පෙනී නොසිටින ලදි
පොදු අධිකාරිය - ඒ.ඩී. බණ්ඩාර, පරිපාලන නිලධාරී

| | |
|---|---|
| තොරතුරු ඉල්ලීම ගොනු කරන ලද දිනය | 2018.04.26, 2018.05.27, 2018.11.10 |
| තොරතුරු නිලධරයා තීරණය ලබා දුන් දිනය | - |
| නම් කළ නිලධරයා වෙත අභියාචනය යොමු කළ දිනය | 2018.06.10, 2018.09.10, 2018.10.15 හා 2018.11.10 |
| නම් කළ නිලධරයා තීරණය ලබා දුන් දිනය | - |
| තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව වෙත අභියාචනය යොමුකළ දිනය | 2018.12.12 |

**අභියාචනයට පසුබිම් වූ කරුණු:**

අභියාචක විසින් පහත දැක්වෙන තොරතුරු ඉල්ලා සිටින ලදි.

*2018.04.26 දිනැති තොරතුරු ඉල්ලීම-*

1. *කුරුවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පහත සඳහන් සේවකයන්ගේ 2015,2016,2017.06.30 දක්වා අතිකාල දීමනා ගෙවීමට අදාළ වවුචරවල සහතික කල පිටපත්*

1. ජේ.ඒ.ටී.ආර්.ජයසින්ග්හේ-කා.කා.සේ. III
2. ටී.ඒ . සිසිර කුමාර - කා.කා.සේ.
3. ජේ.ටී. සුනිල්-කා.කා.සේ.

2. අංක DP/3/18/2017 සහ 2018.03.26 දිනැති චෝදනා පත්‍රයේ කියැවෙන පාවහන්වලට අදාලව මුදල් වෙන් කළ ලිපියේ සිට ඒවා බෙදා හැරීම, ඉතිරිය ගබඩා කිරීම ආදිය දක්වා කටයුතු කළ ලිපිගොනුවේ සහතික කළ පිටපතක්
3. ඉහත පාවහන් පිළිබඳ මුදල් රෙගුලාසි අනුව ක්‍රියා කිරීම පිළිබඳ වූ පහත සඳහන් විස්තර
   (අ) ගෙවීමේ වවුචරයේ හෝ වවුචර්වල අමුනුම්ද සමග සහතික කළ පිටපත්

   (ආ) ප්‍රතිලාභී ලේඛණයේ පිටපත

   (ඇ) බෙදා හැරීමේ ලේඛණයේ පිටපත

   (ඈ) ලැබීම් නියෝගයේ පිටපත

   (ඉ) නිකුත් කිරීමේ නියෝග පිටපත්

   (ඊ) මිලටගත් පවහන්වල නිෂ්පාදිත අනුක්‍රමික අංක හා නිෂ්පාදිත වර්ෂ සහිත ඉන්වොයිසයේ පිටපතක්

4. සපත්තු ගබඩා කර තිබුණා යයි චෝදනා පත්‍රයේ කියවෙන නිල නිවසේ ලිපි ගොනුවේ 2014.01.01 සිට 2017.12.31 දක්වා සියලුම ලිපිවල සහතික කළ පිටපත්
5. කුරුවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සහ මුරසේවයට අදාළ රාජකාරී පැවරුම් සිදු කළ අංක KUDS/ADM/HR/1/PER/1/2017 ගොණුවේ සහ ඊට අදාළ වෙනත් ගොනු ඇත්නම් එම ගොණුවල 2014/2017 වකවාණුවට අදාළ ලිපි ලේඛණ පිටපත්
6. මුරකරුවන්ගේ පැමිණීමේ ලේඛණයේ (පොදු 18) 2015,2016,2017 වර්ෂවල සහතික කළ පිටපත්
7. ඉහත අංක 2 හි සඳහන් ලිපිගොනුවේ පහත සඳහන් ලිපිලේඛණ ඇතුළත්ව නැත්නම් ඒවායේ පිටපත්
   1. පාවහන් මිලට ගැනීමට අදාළ සාද්‍යතා වාර්තාවේ පිටපතක්
   2. ඊට අදාළ ඇස්තමේන්තුවේ පිටපතක්
   3. ටෙන්ඩර් මණ්ඩල වාර්තාවේ පිටපතක්
   4. තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාවේ පිටපතක්

2018.05.27 දිනැති තොරතුරු ඉල්ලීම -

1. කුරුවිට ප්‍රා.ලේ. කාර්යාලයේ පහත සඳහන් නිලධාරීන්ගේ රාජකාරී ලැයිස්තුවල පිටපතක්

I. ගබඩා භාරකරු/ගබඩාභාර කළමණාකාර සහකාර
II. ගණකාධිකාරී
III. මුරකරුවන්
IV. කේ.එම්. චන්ද්‍රාවතී මිය කළමනාකරණ සහකාර
V. ඒ.ධම්මිකා බණ්ඩාර මිය පරිපාලන නිළධාරි
VI. යූ. අනුරාධ උක්වත්ත මයා කළමණාකරන සහකාර
VII. කේ.ඒ.එස්.ජේ. කළුබෝවිල මයා කළමනාකරණ සහකාර

*2. 2016 හා 2017 වර්ෂවල වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාවල පිටපත්*

*3. ප්‍රා.ලේ. නිල නිවස අවසන්වරට අලුත් වැඩියා කිරීමට අදාළ අවසන් බිල්පතේ පිටපත*

*4. 2016/2017 වර්ෂවල දෛනික මුර රාජකාරි බාරගැනීමේ ලේඛණයේ පිටපතක්*

*2018.11.10 දිනැති තොරතුරු ඉල්ලීම -*

1. *2017.06.14 සිට 2017.06.27 දක්වා කුරුවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සියලුම නිලධාරීන් සහ කනිෂ්ඨ සේවකයන්ගේ පොදු 18 පැමිණීමේ ලේඛණයේ අදාළ පිටුවල සහතික කළ පිටපත්*
2. *2016.12.01 සිට 2017.06.27 දක්වා කුරුවිට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සේවය කළ කාර්යාල සේවක සේවයට අයත් රාජකාරි ලැයිස්තුවල පිටපත් (මා වෙත නිකුත් කළ ලිපිය අවශ්‍ය නොවේ. එය ලබා දී ඇත.)*

තොරතුරු නිලධාරියා තොරතුරුවලින් කොටසක් ලබාදීමෙන් අතෘප්තියට පත් අභියාචක 2018.06.10, 2018.09.10, 2018.10.15 හා 2018.11.10 යන දිනයන් හිදී නම්කළ නිලධාරියාට අභියාචනා යොමුකරන ලදි. පනතේ නියමිත කාල සීමාවට අනුකූලව නම්කළ නිලධාරියා ප්‍රතිචාර දැක්වීමට අපොහොසත් වීම මත අභියාචක 2018.12.12 දින කොමිෂන් සභාවට අභියාචනයක් යොමුකරන ලදි.

**අභියාචනය සලකා බලන අවස්ථාවේ දී උද්ගත වූ කාරණා:**

අභියාචනා විභාගය සඳහා අභියාචක පැමිණ නොමැති බව කොමිෂන් සභාව නිරීක්ෂණය කර සිටී.

පොදු අධිකාරිය විසින් 2019.04.12 දිනැතිව කොමිෂන් සභාව වෙත යොමුකර ඇති ලිපිය කෙරෙහි කොමිෂන් සභාවේ අවධානය යොමුවිය. එහි සඳහන් වන්නේ අභියාචක විසින් ඉල්ලීම් කරන ලදුව ඔහු වෙත අදාළ තොරතුරු ලබාදුන් අතර, එම තොරතුරු ලබාදුන් ලිපියෙහි පිටපත් මේ සමඟ කොමිෂන් සභාවේ අවධානය පිණිස යොමුකරන බවයි.

එසේම අභියාචක විසින් 2019.04.23 දිනැතිව කොමිෂන් සභාව වෙත දන්වා ඇත්තේ අභියාචක විසින් අයදුම්කර ඇති තොරතුරු තවමත් පොදු අධිකාරිය විසින් සම්පූර්ණ වශයෙන් ලබා දී නොමැති බවත් රටේ පවතින ආරක්ෂිත තත්වය හේතුවෙන් අභියාචනා විභාගය සඳහා සහභාගී වීමට දුෂ්කර වන බවත්ය.

කෙසේ නමුත් පොදු අධිකාරිය විසින් අභියාචනයේදී කරුණු දක්වා සිටියේ අභියාචක විසින් අයදුම්කරන ලද සියලු තොරතුරු අවස්ථා ගණනාවකදීම ඔහුට ලබා දී ඇති බවයි.

**නියෝගය:**

අභියාචක විසින් අයදුම්කර ඇති තොරතුරු, හැකිතාක් දුරට පොදු අධිකාරිය විසින් ලබා දී ඇති බව නිරීක්ෂණය වන අතර ලබාදුන් තොරතුරු සම්බන්ධව අභියාචක සෑහීමකට පත් නොවන්නේ නම් ඒ පිළිබඳව මෙම නියෝගය ලැබී සති දෙකක කාලයක් ඇතුළත කොමිෂන් සභාවට දැනුම් දෙන ලෙස නියෝග කරනු ලැබේ.

මීට යටත්ව අභියාචනය මින් අවසන් කරනු ලැබේ.

කොමිෂන් සභා රීතින්හි, රීති අංක 27 (ගාස්තු හා අභියාචනා කාර්යය පටිපාටිය, ගැසට් අංක 2004/66, 2017.02.03) ප්‍රකාරව මෙම නියෝගය දෙපාර්ශවය වෙත සන්නිවේදනය කරනු ලැබේ.

****